
# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය - පෙරහුරු විභාගය 2019 (2020)


## විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස්

1. පරිශීලක ගිණුම සකසා ගැනීම

i. ඔබ මෙම උපදෙස් බාගත කර ගත් වෙබ් පිටුවෙහි දැක්වෙන "Create New Account " (රූපය 1.i.a ) බොත්තම මත ක්ලික් කර ලියාපදිංචි වීමේ පෝරමය (Registration Form - රූපය 1.i.b) ලබා ගන්න.





රූපය 1.i.a




රූපය 1.i b

ii. ඉහත පෝරමය සම්පූර්ණ කර, "Create my new account" (රූපය 1.ii) බොත්තම මත ක්ලික් කිරීමෙන් ඔබගේ පරිශීලක ගිණුම සැකසේ.





රූපය 1.ii

iii. ඔබගේ පරිශීලක නාමය (user name) හා මුරපදය (password) මතු ප්‍රයෝජනය සඳහා සුරැකි ව තබා ගන්න.


2. විභාග පද්ධතිය පරිහරණය කිරීම

i. ඔබගේ පරිශීලක ගිණුමට අදාළ පරිශීලක නාමය හා මුරපදය භාවිත කර පද්ධතියට ප්‍රවේශ (login) වන්න (රූපය 2.i).





රූපය 2.i

ii. ප්‍රශ්න පත්‍රයට ප්‍රවිෂ්ට වීම සඳහා පළමු ව මුල් පිටුවෙහි (Home Page) ඇති “Mock Examination” යන පින්තූරය සමග වන “Course” යන බොත්තම මත (රූපය 2.ii) ක්ලික් කරන්න.





රූපය 2.ii

iii. ඉන් පසුව දිස් වන වෙබ් පිටුවෙහි Self-Enrolment (Student) යටතේ දක්වා ඇති “Enrol me” බොත්තම (රූපය 2.iii) මත ක්ලික් කරන්න.





රූපය 2.iii

iv. ඉන් අනතුරුව එක් එක් මාධ්‍යයට අදාළ ප්‍රශ්න පත්‍ර ඔබට දිස්වන අතර, ඔබගේ මාධ්‍යයට අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා එය මත ක්ලික් කරන්න (රූපය 2.iv).





රූපය 2.iv

v. ඔබගේ ප්‍රශ්න පත්‍රය ඉන් පසු ඔබට දිස්වන අතර, “Attempt quiz now” බොත්තම (රූපය 2.v.a) මත ක්ලික් කරන්න, මේ සමග ම “Start Attempt” යනුවෙන් තහවුරු කොටුවක් (Confirm Box) ඔබට දිස් වේ. එහි “Start Attempt” බොත්තම (රූපය 2.v.b) මත ක්ලික් කොට ඔබගේ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු දීම අරඹන්න.





රූපය 2.v.a




රූපය 2.v.b

vi. මෙතැන් පටන් ඔබට පිළිතුරු දීමට ඉතිරි ව ඇති කාලය ක්‍රමයෙන් අඩු වීමට පටන් ගන්නා අතර, ඉතිරි ව ඇති කාලය වෙබ් පිටුවේ දකුණු පස “Quiz Navigation” යන පාඨයට පහළින් දැක ගත හැක (රූපය 2.vi).





රූපය 2.vi


vii. “Quiz Navigation” යටතේ ප්‍රශ්න පෙළගැස්ම ඔබට දැක ගත හැකි වේ. සම්පූර්ණ ප්‍රශ්නයට පහළින් වන “Next” (රූපය 2.vii.a) බොත්තම මත ක්ලික් කිරීමෙන් හෝ “Quiz Navigation” හි ප්‍රශ්නයට අදාළ සිඟිති රුව (Thumbnail - රූපය 2.vii.b) මත ක්ලික් කිරීමෙන් හෝ ඔබට ප්‍රශ්න අතර මාරු විය හැක. ඔබ කිසියම් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමෙන් පසු එහි සිඟිති රුවෙහි වර්ණය වෙනස් වනු ඔබට දැක ගත හැකි වනු ඇත (රූපය 2.vii.c).




රූපය 2.vii.a





රූපය 2.vii.b





රූපය 2.vii.c

viii. ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා, අවසානයේ දී වෙබ් පිටුවේ දකුණු පස පහළ කෙළවරෙහි “Finish Attempt” යන බොත්තම (රූපය 2.viii.a) හෝ 47 වන ප්‍රශ්නයට පහළින් වන " Finish Attempt " යන බොත්තම (රූපය 2.viii.b) මත ක්ලික් කිරීමෙන් අනතුරුව ඔබ විසින් කරන ලද පිළිතුරු සැපයීම පිළිබඳ සාරාංශයක් ඔබට දැක ගත හැකි වනු ඇත.





රූපය 2.viii.a




රූපය 2.viii.b

ix. ඔබගේ පිළිතුරු සැපයීම අවසන් බවට තහවුරු කිරීම සඳහා “Submit All and Finish” බොත්තම (රූපය 2.ix ) මත ක්ලික් කරන්න. (අවධානයට : මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලබා දී ඇති කාලය ඉක්මවා ගිය පසු ස්වයංක්‍රීය ව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම නිම වේ.)




රූපය 2.ix

x. අවශ්‍ය නම් නැවත ඕනෑම වාරයක් මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ඔබට පෙනී සිටිය හැක

3. මේ පිළිබඳ ව කිසියම් ගැටළුවක් වෙතොත් doeonlineexams@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට එය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය වැඩිදුර උපදෙස් හා තොරතුරු ලබා ගත හැක.

4. Mock Examination වෙබ් පිටුවෙහි අවසානයේ දක්වා ඇති Give a Feedback Click කර එහි ඔබගේ අදහස් සහ යෝජනා ඇතුළත් කරන්න.